16223

16.11.2016

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

## බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
## மேல் மாகாணக் கல்வித் திணைக்களம்
## Department of Education - Western Province

### වර්ෂ අවසාන ඇගයීම
### ஆண்டிறுதி மதிப்பீடு - 2016
### Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: චිත්‍ර | පත්‍රය / வினாத்தாள் / Paper: I | පැය / மணித்தியாலம் / Hours: 01 |

★ ප්‍රශ්න සියල්ලට ම මෙම පත්‍රයේ ම පිළිතුරු සපයන්න.

● පහත දැක්වෙන කලා කෘතිය හඳුනාගෙන ඒ ආශ්‍රයෙන් අසා ඇති ප්‍රශ්න වලට නිවැරදි පිළිතුරු හිස්තැන් මත ලියන්න.



ඉහත ඡායාරූපයෙන් දැක්වෙන්නේ ①........................................ යුගයට අයත් ②.............................. බුද්ධ ප්‍රතිමාවයි. මෙහි දැක්වෙන මුද්‍රාව ③ ........................................ වන අතර ඉන්දියාවේ ④.............................................. කලා ලක්ෂණ මෙයට බලපා ඇති බව විචාරක මතයයි. හිසෙහි ඉහළින් සවි කර ඇති ⑤ ........................................පසුව එකතු කළ අංගයක් ලෙසට සැලකේ.

● ප්‍රශ්න අංක 06 සිට 10 දක්වා දී ඇති ප්‍රශ්න වලට වඩාත් ගැලපෙන නිවැරදි පිළිතුරු තෝරා එයට හිමි අංකය වරහන තුළ ඇති තිත් ඉර මත ලියන්න.

6. "43 කණ්ඩායම" නම් වූ සුප්‍රසිද්ධ කාටුන් චිත්‍රය අඳින ලද ශිල්පියා වන්නේ,
   1. ඇම්. සාර්ලිස් ය.
   2. රිචඩ් ගේබ්‍රියෙල් ය.
   3. ඕබ්රි කොලට් ය.
   4. ඩබ්ලිව්. විජේසෝම ය. (........)

7. ඝණිකවාදී ශෛලිය ද අනුගමනය කරමින් දමිළ චිත්‍ර ශිල්පියෙකු වූ ඒ. මාර්ක් විසින් සිතුවම් කරන ලද නිර්මාණයක් වන්නේ,
   1. සකුන්තලා
   2. කියවන ළමයා
   3. සුදු කුකුළා
   4. අගස්තියර් හා විනයාගර් (.......)

8. මහාචාර්ය සෙනරත් පරණවිතාන මහතාගේ මතයට අනුව ඉසුරුමුණි කැටයම් අතර දැකිය හැකි "මිනිසා සහ අශ්ව හිස" කැටයම තුළින් නිරූපණය වන්නේ,
   1. යුද්ධයට ගිය සෙබළෙක් විඩා නිවන අවස්ථාවක් වේ.
   2. අග්නි හා පර්ජන්‍ය වේ.
   3. රජ කෙනෙකු මහාරාජ ලීලාසන ඉරියව්වකින් සිටින ආකාරයක් වේ.
   4. අශ්වාරෝහකයෙක් වේ.

9. පොළොන්නරු ගල් විහාර ප්‍රතිමා පෙළ අතර දැකිය හැකි සුවිසල් හිටි බුද්ධ ප්‍රතිමාවේ දැක්වෙන්නේ,

1. අභය මුද්‍රාවයි. 2. ආශි මුද්‍රාවයි.


3. විතර්ක මුද්‍රාවයි 4. පරදුක්ඛ දුක්ඛිත මුද්‍රාවයි (........)

10. මහනුවර ශ්‍රී දළදා මාලිගාවේ පත්තිරිප්පුව නිර්මාණය කිරීමේ ගෞරවය හිමිවන්නේ,

1. දේවේන්ද්‍ර මූලාචාරීන්ට ය. 2. දෙල්මඩ මූලාචාරීන්ට ය.


3. දෙවරගම්පල සිල්වත් තැනට ය. 4. සිත්තර නයිදේ ටය. (........)

- අංක 11සිට 15 දක්වා පිළිතුරු සැපයීමේ දී A,B,C,D,E යන රූප සටහන් උපයෝගී කර ගන්න. නිවැරදි පිළිතුරු තිත් ඉර මත ලියන්න.


A


B


C


D


E

11. A අක්ෂරයෙන් දැක්වෙන කුඹල් හල නම් වූ සිතුවම අඳින ලද ශිල්පියා කවුද?..............................

12. B අක්ෂරයෙන් දැක්වෙන්නේ ශ්‍රී ලාංකික පැරණි සිතුවම් කලාවේ අග්‍ර ඵලයකි. මෙම සිතුවම පිළිබඳ ශ්‍රී ලංකාවේ සිටි පුරා විද්‍යාඥයෙකු වූ එච්.සී.පී. බෙල් මහතාගේ මතය කුමක් ද?..............................

..............................

13. පහතරට සිතුවම් සම්ප්‍රදාය තුළ විහාර රැසකින් අගනා සිතුවම් පෙළක් හමු වන අතර කරගම්පිටිය විහාරයේ දැකිය හැකි නිර්මාණයක් C අක්ෂරයෙන් දැක්වේ. එම සිතුවම නම් කරන්න..............................

..............................

14. ජී.එස්. ප්‍රනාන්දු ශිල්පියා දිය සායම් චිත්‍ර කලාවට දක්ෂතා දැක්වූ කෙනෙකු වන අතර ඔහුගේ සුප්‍රසිද්ධ චිත්‍රයක් D අක්ෂරයෙන් දැක්වේ. එම සිතුවමේ නම කුමක්ද? ..............................

15. පැරණි විහාර සිතුවම් කලාවේ විශිෂ්ට සිතුවම් පෙළකින් උපුටා ගත් "දේවාරාධනාව" නමැති චිත්‍රයේ කොටසක් E අක්ෂරයෙන් දැක්වේ. එම සිතුවම හමුවන ස්ථානය කුමක්ද? ..............................

- අංක 16 සිට 20 දක්වා දී ඇති වචන වල අර්ථය පැහැදිලි වන සේ චිත්‍ර කලාවට අදාළ සම්පූර්ණ වාක්‍යය බැගින් ලියන්න.

16. ක්‍යුරොස්කුරෝ -..............................


17. උෂ්ණීෂය - ..............................



18. අඛණ්ඩ කථන ක්‍රමය - ..............................


19. මිනාර්/මිනාරට් - ..............................

20. පර්යාලෝකය - ..............................


● ප්‍රශ්න අංක 21 සිට 25 දක්වා දී ඇති රූප වලට වඩාත් ඍජු සම්බන්ධතාවක් දක්වන රූප සටහන ඒ ඉදිරියේ ඇති F,G,H,I,J යන රූප සටහන් අතුරින් සොයා එහි අක්ෂරය වරහන තුළ ඇති තිත් ඉර මත ලියන්න.

21.  (.........)  F

22.  (.........)  G

23.  (.........)  H

24.  (.........)  I

25.  (.........)  J

● ප්‍රශ්න අංක 26 සිට 30 දක්වා අසා ඇති ප්‍රශ්න වලට වඩාත් ගැලපෙන පිළිතුර, අදාළ පිළිතුරු අතරින් තෝරා නිවැරදි පිළිතුර යටින් ඉරක් අඳින්න.

26. දැවමය කැටයමක් නිර්මාණයේ දී ශිල්පියා වඩාත් සැලකිලිමත් විය යුත්තේ

   1. පරිමාණය, වස්තු විෂය සහ අවකාශය භාවිතය පිළිබඳව ය.
   2. හැඩතල භාවිතය, උචිත බව සහ උන්නත ලක්ෂණ ය.
   3. වර්ණ භාවිතය, සරළ බව සහ රූප සම්පිණ්ඩනය පිළිබඳව ය.
   4. පර්යාලෝකය, කැටයම් වල සියුම් බව, ශිල්පීය කුසලතා ය.

27. දිය සායම් මාධ්‍ය සිතුවමක් තුළ දැකිය හැකි ප්‍රධාන ලක්ෂණ වන්නේ,

   1. වර්ණාවලියේ සනත්වය, වර්ණ පර්යාලෝකය සහ සම්පිණ්ඩනය ය.
   2. මූලික වර්ණ යෙදීම, ජලය වැඩිපුර භාවිතය සහ පින්සල ක්‍රමවත්ව හසුරුවා තිබීම.
   3. විනිවිද පෙනෙන සුළු බව, වර්ණ ප්‍රභේද දැක්වීම සහ මාධ්‍යයට උචිතව යෙදූ රේඛා හැඩතල භාවිතය.
   4. මනා රූප සම්පිණ්ඩනය, ද්විතියික වර්ණ භාවිතය සහ සුදුසු පින්සල් භාවිතය.

28. විවිධ භාණ්ඩ සඳහා දවටනයක් නිර්මාණය කිරීම අයත් වන්නේ,

1. ග්‍රැෆික් චිත්‍ර අංශයට ය.
2. චිත්‍ර සම්පිණ්ඩන අංශයට ය.
3. මොනොක්‍රෝම් චිත්‍ර අංශයට ය.
4. එච්න් මුද්‍රණ අංශයට ය.



29. ඝණකවාදී චිත්‍ර කලා සම්ප්‍රදාය ලෙසට හැඳින්විය හැක්කේ,

1. හැඩතල සඳහා ස්වභාවිකව යෙදූ රේඛාව තව දුරටත් වර්ධනය කරමින් සිතුවම් නිර්මාණය කිරීම වේ.
2. පාරම්පරික සිතුවම් කලාවේ දියුණු වූ මෙන් ම වර්ධනීය වූ අවස්ථාවක් නිරූපණය කිරීම වේ.
3. ව්‍යුක්තරූපික හැඩතල විවිධ අතට යොදමින් සරළ මෙන් ම සංකීර්ණ හැඩතල අර්ථවත් ව යොදමින් සිතුවම් නිර්මාණය කිරීම වේ.
4. චිත්‍ර ශිල්පයේ විවිධ වූ ශිල්ප ක්‍රම සංකලනය කරමින් නිර්මාණය කරනු ලබන සිතුවම් ක්‍රමය වේ.

30. සන්නිදර්ශන චිත්‍ර යනු,

1. පැරණි විහාර තුළ දැකිය හැකි වූ ආදර්ශවත් ජාතක කතා සිතුවම් ය.
2. චිත්‍රයක කතා නායකයා විශාලව දක්වා සෙසු චරිත කුඩාවට පෙන්වා අඳිනු ලබන සිතුවම් ය.
3. කලය අර්ථවත් ව හසුරුවමින් පරිමාණ හා පර්යාලෝක රීති අනුගමනය කරමින් අඳිනු ලබන සිතුවම් ය.
4. කිසියම් කවියකට හෝ කතාවකට ගැලපෙන ආකාරයට අර්ථය පැහැදිලි වන සේ අඳිනු ලබන චිත්‍ර ය.

- ප්‍රශ්න අංක 31 සිට 35 දක්වා ප්‍රශ්න වලට පිළිතුරු සැපයීමේ දී K, L, M, N, O යන රූප සටහන් උපයෝගී කර ගන්න.

| K | L | M | N | O |
|---|---|---|---|---|
|  |  |  |  |  |

31. සංස්ලේෂණාත්මක ඝණකවාදී හා එකලස් කලාවේ නිර්මාණයක් වූ "නම් නොකළ" නම් වූ කෘතිය දැක්වෙන අක්ෂරය කුමක් ද? ................................

32. ව්‍යුක්ත රූපික හැඩතල යොදමින් හෙන්රි මුවර් ශිල්පියා කළ නිර්මාණය දැක්වෙන්නේ කුමන අක්ෂරය සහිත රූප සටහනේ ද? ................................

33. ඉන්දීය කලාවේ ස්වර්ණමය යුගය වූ ගුප්තකලා ආභාසය ලබමින් නිර්මාණය වූ කෘතියක් ඉහත දැක්වේ. එම කෘතිය අයත් වන අක්ෂරය කුමක් ද? ................................


16273 Grade 11 16.11.2016

Learning Resource Center R De Mazenod College Kandana

34. පොළොන්නරු යුගයේ ලෞකික මූර්ති කලාවේ විශිෂ්ට ලක්ෂණ දැකිය හැකි කෘතියක් ඉහත ඡායාරූප අතර වේ. ඊට අයත් අක්ෂරය කුමක් ද? ....................................

35. ඊජිප්තු කලාවේ හමුවන ක්‍රි.පූ. 2600 ට පමණ අයත් මූර්තියක් ඉහත කෘති අතර වේ. එය දැක්වෙන්නේ කුමන ඉංග්‍රීසි අක්ෂරය යටතේ ද ? ....................................

- ප්‍රශ්න අංක 36 සිට 40 දක්වා පහත සඳහන් කලාකෘතිය හඳුනාගෙන එහි කලාත්මක අගය විග්‍රහ කෙරෙන පරිදි දී ඇති උප මාතෘකා වලට අනුව අර්ථවත් වාක්‍ය පහක් ලියන්න.



36. ස්ථානය -..............................................................................................

37. තේමාව - ..............................................................................................

38. ශිල්පියා -..............................................................................................

39. මාධ්‍ය හා ශිල්ප ක්‍රමය -..............................................................................
..............................................................................

40. ශිල්පීය කුසලතාවය - ..............................................................................
..............................................................................
..............................................................................

(ලකුණු 1×40 = 40 යි)

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

16209

Grade - 11 16.11.2016

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education - Western Province

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
Year End Evaluation

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: චිත්‍ර | පත්‍රය / வினாத்தாள் / Paper: II | පැය / மணித்தியாலம் / Hours: 02 |

- නිදහස් රේඛාමය ඇඳීම සහ වර්ණ චිත්‍ර සම්පිණ්ඩනය
- ඔබ ඉදිරියේ තබා ඇති ද්‍රව්‍ය සමූහය හොඳින් නිරීක්ෂණය කොට,

1. රේඛා මගින් පූර්ව අධ්‍යයනයක යෙදෙන්න.
2. ද්‍රව්‍ය සමූහය ඔබට පෙනෙන අයුරින් ඇඳ වර්ණ කරන්න.

- මෙම චිත්‍ර දෙක ම එකට අමුණා ශාලාධිපතිට භාර දෙන්න.
- ඔබේ චිත්‍රය ඇඳීමේ දී පහත සඳහන් කරුණු කෙරෙහි සැලකිලිමත් වන බව සලකන්න.

රේඛා අධ්‍යයනය

1. පූර්ව අධ්‍යයනයේ දී දක්වන කුසලතා

වර්ණ චිත්‍රය

2. ද්‍රව්‍ය සමූහය තලය මත කලාත්මකව සම්පිණ්ඩනය වීම.
3. පරිමාණය, පර්යාලෝක රීති හා ත්‍රිමාන ලක්ෂණ පිළිබඳ අවබෝධය.
4. දෙන ලද ද්‍රව්‍ය සමූහයේ මතුපිට ස්වභාවය සහ ගති ලක්ෂණ දැක්වීම.
5. වර්ණ හැසිරවීමේ ශිල්පීය කුසලතාව.
6. උචිත පසුබිමක් යෙදීම සහ සමස්ත නිමාව.

ද්‍රව්‍ය සමූහය තබා ඇති ලෑල්ල විශාල ලෙස ඇඳීම අවශ්‍ය නොවේ. ලෑල්ලේ පරිමාණය ද්‍රව්‍ය සමූහයට ගැලපෙන අයුරින් වෙනස් කර ඇඳීමට ඔබට අවසර ඇත.

(ලකුණු 30 යි)

16262

සියලු ම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

Learning Resource Center

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
மேல் மாகாணக் கல்வித் திணைக்களம்
**Department of Education - Western Province**

වර්ෂ අවසාන ඇගයීම
ஆண்டிறுதி மதிப்பீடு - 2016
**Year End Evaluation**

16 · 11 - 2016

| | | | |
|---|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 11 | විෂයය / பாடம் / Subject: චිත්‍ර | පත්‍රය / வினாத்தாள் / Paper: III | පැය / மணித்தியாலம் / Hours: 02 |

★ සැලකිය යුතුයි.

- ඔබ ඇඳිය යුත්තේ එක් චිත්‍රයක් පමණි.
- ඔබේ විභාග අංකය හා ප්‍රශ්න අංකය උත්තර පත්‍රයේ පසුපිටේ ලියන්න.
- උත්තර පත්‍රය (චිත්‍රය) ශාලාධිපතිට භාරදීමට පෙර වියළී තිබිය යුතුය. (දිය සායම් චිත්‍රයක් නම්)
- ඕනෑම වර්ණ මාධ්‍යයක් භාවිත කළ හැකි අතර පෙල්ට් පෑන් භාවිතය සුදුසු නැත.
- "අ" හෝ "ආ" හෝ "ඉ" කොටස් තුනෙන් එක් කොටසක් පමණක් තෝරාගන්න.

<u>"අ" කොටස - ප්‍රකාශන චිත්‍ර</u>

01. නාගරික පරිසරයක කොන්ක්‍රීට් අතුරමින් මාර්ගයක් සකස් කරමින් සිටින කම්කරුවන් පිරිසක්
02. බෞද්ධ, හින්දු, ක්‍රිස්තියානි හෝ ඉස්ලාම් ආගමික ස්ථානයක ආගමික උත්සවයක අවස්ථාවක්
03. ධීවර කර්මාන්තයේ යෙදී සිටින ධීවර කාර්මිකයින් පිරිසක්
04. කුඹුරක වැඩෙහි යෙදී සිටින ගොවියන් සඳහා කෙතට ඇඹුල ගෙනා අවස්ථාවක්

<u>"ආ" කොටස - මෝස්තර නිර්මාණය</u>

05. ස්වභාවික කොළ සහ මල් වල හැඩ නිර්මාණාත්මකව වෙනස් කර ගනිමින් බුමුතුරුණකට සුදුසු මුළුතල මෝස්තරයක් නිර්මාණය කරන්න. (ප්‍රමාණය අඟල් 7 ½ X 7 ½ )
06. සාම්ප්‍රදායික සැරසිලි මෝස්තර යොදා ගනිමින් සංස්කෘතික උත්සවයකට සුදුසු පතාකයක් නිර්මාණය කරන්න.
07. විවිධ නිර්මාණාත්මක සැරසිලි යොදා ගනිමින් වෘත්තාකාර මේසයකට ඇතිරීමට සුදුසු මේස රෙද්දක් නිර්මාණය කර වර්ණ කරන්න.
08. සත්ත්වයෙකුගේ සරළ හැඩ ඇසුරින් දොර රෙද්දකට සුදුසු ව්‍යාප්ත මෝස්තරයක් නිර්මාණය කරන්න.

<u>"ඉ" කොටස - ග්‍රැෆික් චිත්‍ර</u>

09. පාසලේ පැවැත්වීමට නියමිත කලා උළෙල ප්‍රචාරය කිරීම සඳහා පෝස්ටරයක් සැලසුම් කර වර්ණ කරන්න. අවශ්‍ය පරිදි අක්ෂර ද යොදන්න. (ප්‍රමාණය අඟල් 7 x 10)
10. මහනුවර යුගයේ බිතු සිතුවම් යන මැයෙන් ලියවෙන පොතකට සුදුසු පිටකවරයක් නිර්මාණය කරන්න. (ප්‍රමාණය අඟල් 7 x 9)
11. වෙළඳ පොළට හඳුන්වා දීමට නියමිත නවතම චොක්ලට් වර්ගයක් සඳහා සුදුසු දවටනයක් සැලසුම් කර වර්ණ කරන්න. සුදුසු නමක් යොදා ගත හැකිය.
12. ඔබ දන්නා ප්‍රසිද්ධ ජන කවියකට හෝ ජන කතාවකට සුදුසු සන්නිදර්ශන චිත්‍රයක් ඇඳ වර්ණ කරන්න.

(ලකුණු 30 යි)